මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை.
The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | BD/NSLE/103/DMD/09/2025 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2025.12.01 |

**අයවැය චක්‍රලේඛ අංක: 06/2025**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපති
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

**හදිසි ආපදා තත්ත්වය හේතුවෙන් බිඳ වැටී ඇති ජන ජීවිතය කඩිනමින් යථා තත්ත්වයට පත් කිරීම**

උදා වී ඇති හදිසි ආපදා තත්ත්වය යටතේ බිඳ වැටී ඇති ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීමට හැකිවන පරිදි භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා සඳහා වන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ අත්පොත - 2024 හි සඳහන් 3.1.8 වගන්තිය අනුව බාධාවකින් තොරව හා කඩිනමින් කටයුතු කරන මෙන් දන්වා සිටිමි.

02. ඉහත මාර්ගෝපදේශ සංග්‍රහයේ සහ අත්පොතෙහි 2.9 වගන්තිය යටතේ ප්‍රධාන ගනන්දීමේ නිලධාරීන්ට රු. මිලියන 750 ක මූල්‍ය සීමාවක් ලබා දී ඇත. එසේම දෙපාර්තමේන්තු ප්‍රධානියෙකුට රු. මිලියන 400 ක මූල්‍ය සීමාවක් තුළ කටයුතු කිරීමේ හැකියාව ඇත. ඒ අනුව, ප්‍රකාශයට පත්කර ඇති විස්තීරණ ආපදා තත්ත්වය යටතේ සිදු කළ යුතු වියදම් කිසිදු බාධාවකින් තොරව කඩිනමින් සිදු කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයෙකුට හා පළාත් ප්‍රධාන ලේකම්වරයෙකුට රු. මිලියන 150 ක් දක්වා සහ දෙපාර්තමේන්තු ප්‍රධානියෙකුට, දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයෙකුට රු. මිලියන 100 ක් දක්වා වියදම් දැරිය හැකි බව දන්වා සිටිමි.

03. ඉහත සීමාවන් ඉක්මවා කටයුතු කිරීමට අවශ්‍යවන්නේ නම් කඩිනමින් භාණ්ඩාගාරයේ ලේකම් වෙත දැන්වීමට කටයුතු කළ යුතු වේ.

04. මෙම චක්‍රලේඛය ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ එකඟතාවය මත නිකුත් කරන ලදි.

**ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම**
**භාණ්ඩාගාරයේ ලේකම්**

පිටපත් :
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. සභාපති, මුදල් කොමිෂන් සභාව
5. සභාපති, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව
6. විගණකාධිපති

(මේ පිළිබඳව අවශ්‍ය පැහැදිලි කර ගැනීම් වේනම්, දුරකථන අංක 071-5348638 මගින් මහලේකම්, ප්‍රසම්පාදන කොමිෂන් සභාව සහ දුරකථන අංක 071-8174116/071-6421698 මගින් අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති), ප්‍රසම්පාදන කොමිෂන් සභාව විමසිය හැකිවේ.)